**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**
**-----------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 11 දින කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**-----------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**
**-------**

**2.1 විසර්ජන ගිණුම**
**------------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**
**---------------------------**

කම්කරු දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,550.58 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,925.15 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කම්කරු දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,625.43 ක් හෙවත් සියයට 24.81 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- |
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,489.86 | 1,453.17 | 36.69 | 2.46 |
| මූලධන | 5,060.72 | 3,471.98 | 1,588.74 | 31.39 |
| **එකතුව** | **6,550.58** | **4,925.15** | **1,625.43** | **24.81** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
| --- | --- | --- | --- | --- | --- |
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75.00 | 74.98 | 55.00 | 64.57 | 345.00 | 234.87 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0060/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 20.19 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 1,276.45 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0089/000 | 87.01 |
| 6000/0000/00/0013/0058/000 | 1189.44 |
| **එකතුව** | **1,276.45** |

**2.5 විගණන නිරීක්ෂණය**

කම්කරු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

------------------

### 3.2.1 අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 100 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු. මිලියන 18 ක මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 373 (1) ප්‍රකාරව අග්‍රිම ගිණුමේ දෙසැම්බර් 31 දිනට ඇති ශේෂය එදිනම භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත භාරදී නිරවුල් කළ යුතු වුවත් එසේ නොකර රු.19,760,913 ක නොපිය වූ අත්තිකාරම් ශේෂයක් ලංකා ගමනාගමන මණ්ඩලයේ හිඟ පාරිතෝෂිත ගෙවීම සඳහා මීගමුව හා මාතර දිස්ත්‍රික් කම්කරු කාර්යාල සඳහා ලබා දී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 (2) (ආ) පරිදි තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාගන්නා නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු වුවත්, අවස්ථා 70 ක දී ප්‍රමාද වී අත්තිකාරම් පියවා තිබු අතර කාල පමාව මාස 01 සිට මාස 08 දක්වා විය.

## 3.4 පොදු තැන්පත් ගිණුම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීම සඳහා සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කළ යුතු වුවත්, එසේ පිළියෙල කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 570 (ඇ) සහ 571 (2)(3) පරිදි කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් පසුව ආපසු ලබාගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වලක්වා ගැනීමේ අදහසින් එම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසීම් සිදු කිරීමෙන් අනතුරුව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කලයුතු වුවද විගණනයේදී සිදුකල නියදි පරීක්ෂාවේදී රු.743,177 ක තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල වර්ෂ 02 ඉක්ම වූ සේවක අර්ථසාධක අරමුදල් නොවන ටෙන්ඩර් තැන්පතු රඳවාගැනීම් සහ තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගැනීම් රු. මිලියන 64.64 ක් පැවති අතර මුදල් රෙගුලාසි 570(ඇ) සහ 571(2)(3) ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සේවක අර්ථසාධක අරමුදලට අයවිය යුතු මුදල් සහ සේවා දායකයින්ට හිමි අනිකුත් දීමනා නිසි පරිදි ගෙවීම සේවායෝජකයින් විසින් පැහැර හැරීමේදී එකඟතාවය මත හෝ අධිකරණ ක්‍රියාමාර්ගයකින් අදාළ මුදල් සහ අධිභාර අයකරගැනීමේ බලය කම්කරු කොමසාරිස් වෙත පැවරී තිබුණි. ඒ අනුව කටයුතු කර අයකරගත් මුදල් වාරික ලෙස ලද විගස අදාල සේවකයින්ගේ ගිණුම් වලට බැර කිරීමට කටයුතු කළ යුතු වුවද, වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ නොගෙවූ රු.15,838,924 ක මුදල් පොදු තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,563,387 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 37 ක් දක්වා වූ කාල පරාසයක් ගත වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) **හිඟ ණය ශේෂ**

(i) දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ හිඟ ණය පිළිබඳ කාල විශ්ලේෂණය අනුව 2016 දෙසැම්බර් 31 දිනට අවුරුදු 5 ට වඩා පැරණි අය නොවූ හිඟ ණය ශේෂය රු.1,061,097 ක් ද අවුරුදු 1 සිට අවුරුදු 2 දක්වා වූ පැරණි ණය ශේෂය රු.1,659,389 ක් ද අවුරුදු 2 සිට අවුරුදු 3 දක්වා පැරණි ණය ශේෂය රු.713,786 ක් ද විය.

(ii) ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කළ , සේවය හැර ගිය හා සේවය අවසන් කළ නිලධාරීන් 45 දෙනෙකුගෙන් අය විය යුතු රු. 2,062,519 ක හිඟ ණය ශේෂයක් නිරවුල් කර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 3.2.2 හා 3.2.3 ඡේද පරිදි වර්ෂ 15 ක කාලයක සිට පළාත් සභා වලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.50,777 ක ණය ශේෂය එකවර හෝ මාසිකව අයකරගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.2.5 හි විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම හා මියගිය නිලධාරීන්ගේ ආපසු ගෙවා අවසන් කර නැති ණය මුදලකින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල් එම නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල් වලින් අය කර ගත යුතුය. කෙසේ නමුත් 2016 දෙසැම්බර් 31 දිනට එසේ අයකර නොගත් නිලධාරීන්ගේ හිඟ ණය ශේෂය රු.540,558 විය. ඒ අතර අවුරුදු 5 ට වඩා වැඩි අය කර නොගත් හිඟ ණය ශේෂය රු.180,972 ක් විය.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි

විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | වර්ෂ |
| (i) | තල පරිගණක | 314 | 30,164,096 | 03 |
| (ii) | **මුද්‍රණ යන්ත්‍ර කොටස්**<br>මැලියම් බයින්ඩර් (Glue binder) | 1 | 5,388,690 | 09 |

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

රු.මිලියන 202.20 ක් වැයකර ඉදිකර තිබූ කම්කරු කාර්යාල 02 ට අයත් භූමියේ නීතිමය හිමිකම කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට 2017 අගෝස්තු 31 දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.7 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ප්‍රමාදයන් හා අනුමැතියකින් තොරව ඉදිකිරීම් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) අනුමැතියකින් තොර ඉදිකිරීම්**

ප්‍රාදේශීය කම්කරු කාර්යාල 02 ක රු.මිලියන 187.51 ක ඉදිකිරීම් සම්බන්ධව අදාල පළාත් පාලන ආයතන වෙතින් ඉදිකිරීම් ගොඩනැගිල්ලෙහි සැලැස්ම අනුමත කරවාගෙන නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති ඉටුකිරීමේ අසාමාන්‍ය ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | කොන්ත්‍රාත් අගය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | නිම කළ දිනය | 31/12/2016 දිනට නිම කිරීමේ ප්‍රතිශතය | කාල ප්‍රමාදය |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | රු. | | | | | |
| යාපනය දිස්ත්‍රික් කම්කරු කාර්යාලය අදියර C | 15,498,500 | 2015/07/13 | 2016/01/11 | 2016/12/30 | - | අවුරුදු 01 |
| අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය අදියර I | 24,800,000 | 2014/01/07 | 2014/08/05 | - | 45 | අවුරුදු 02 මාස 05 |

**(ඇ) ව්‍යාපෘති කළමනාකරණ අකාර්යක්ෂමතා**

කම්කරු දෙපාර්තමේන්තු කළමනාකාරිත්වය විසින් ඉදිකිරීම් පිළිබඳ දැනුම සහිත ඉංජිනේරුවරුන්ගෙන් සමන්විත අංශයක් දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කර නොතිබුණ අතර දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් සෘජුවම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. මෙලෙස දෙපාර්තමේන්තුව විසින්ම තරඟකාරී මිල ගණන් කැඳවීම් සිදු නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත්කරුගේ අගය ඉක්ම වූ එකතුව රු.මිලියන 156.2 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අවස්ථා 11 ක දී ගෙවීමට සිදු වී තිබුණි.

## 3.8 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

**(i). ශ්‍රම ප්‍රමිත අංශය**

-----------------

- පඩිපාලක සභා ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත හා 2005 අයවැය සහන දීමනා පනත නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න සොයා බලා ශ්‍රම ප්‍රමිත අංශය වෙත වාර්තා කිරීම කම්කරු නිලධාරීන්ගේ රාජකාරීමය කොටසක් වේ. එසේ වුවද, විගණනයට භාජනය කරන ලද ප්‍රාදේශීය කම්කරු කාර්යාල 10 ක කම්කරු නිලධාරීන් විසින් සැලකිය යුතු අවස්ථා ප්‍රමාණයක දී එලෙස කටයුතු කර නොතිබුණි.

- අයවැය සහන දීමනාව නොලැබීම සහ අනෙකුත් විවිධ වැටුප් ගෙවීම් පිළිබඳ සේවක පාර්ශවයේ ගැටළු විසදීමේ වගකීම පැමිණිල්ලට භාජනය වන ආයතනය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය කම්කරු කාර්යාලයට පවරා තිබූ නමුත් එලෙස යොමු කල පැමිණිලි 26 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(ii). සේවය අවසන් කිරීමේ අංශය**

------------------------------

සේවා යෝජකයන් විසින් අත්තනෝමතිකව නිත්‍යානුකූල නොවන අයුරින් සේවකයින් අඩු කිරීම, තාවකාලිකව ඉවත් කිරීම හා පහ කිරීම වැළැක්වීම සහ එවැනි අවස්ථාවන්හිදී සේව්‍ය සේවක දෙපාර්ශවයටම බලපාන දුෂ්කරතා ගැන මැදහත්ව සොයා බලා නිත්‍යානුකූලව සහන සැලසීම අරමුණු කරගත් සේවය අවසන් කිරීමේ අංශයට සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැමිණිලි 210 ක් ලැබී තිබූ අතර එයින් 88 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විසඳා නොතිබුණි. එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 42 ක් විය.

**(iii). කාර්මික සම්බන්ධතා අංශය**

---------------------------

ආර්ථික නිෂ්පාදනය සහ සංවර්ධනය මෙන්ම ශ්‍රම ඵලදායීතාවයද ඉහල තත්ත්වයකට ගෙන ඒම සඳහා සේව්‍ය සේවක අයිතීන්ද ආරක්ෂා කරමින් රට තුල ආර්ථික හා කාර්මික සාමයක් ඇති කරවීම අරමුණු කරගත් මෙම අංශයට කාර්මික ආරවුල්

සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැමිණිලි 462 ක් ලැබී තිබූ අතර එයින් පැමිණිලි 300 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොවිසඳී පැවතිණි. එම ප්‍රමාණය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 65 ක් විය.

**(iv). කර්මාන්තමය සුරක්ෂිතතා අංශය**

**-----------------------------------**

2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත ක්‍රියාකාරකම් ඉටුකිරීමේදී අපේක්ෂිත ඉලක්ක කරා ලඟා නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| වැඩසටහන ක්‍රියාකාරකම් | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්ක වෙත ලඟා නොවූ ප්‍රතිශතය |
|---|---|---|---|
| කර්මාන්ත ශාලා අනතුරු පරීක්ෂණ සිදු කිරීම. | 6,400 | 4,975 | 22 |
| සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 240 | 177 | 26 |
| පාරිසරික මිනුම් සිදු කිරීම. | 100 | 46 | 54 |

**(v). සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය**

**-----------------------------------------------**

2016 වර්ෂයේ දී මෙම අංශයේ පැවැත්වීමට සැලැසුම් කළ පරිගණක පුහුණු වැඩසටහන් 11 ක් පවත්වා නොතිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 80 ක් විය.තවද "කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු කටයුතු පරිගණකගත කිරීමේ වැඩසටහන (LISA)" ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි. මෙයට ප්‍රධාන බාධාවක් ලෙස දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය මදකම හඳුනාගෙන තිබුණි. නමුත් මෙම අංශය විසින් සැලැසුම් කළ පරිගණක පුහුණු වැඩසටහන් 11 ක් පවත්වා නොතිබීම එම තත්ත්වය වඩාත් තීව්‍ර කරන්නක් වී තිබුණි.

**(vi). කම්කරු කාර්යාලයන්හි කාර්යසාධනය**

**----------------------------------------**

- 2016 දෙසැම්බර් 31 දිනට සියලු කම්කරු කාර්යාලවල වටිනාකම රු.1,803,514,552 ක් වෙනුවෙන් අක්‍රියව පවතින නඩු 3,680 ක් හා

රු.812,197,854 ක් වූ විවෘත වරෙන්තු 2,461 ක් පැවතුණි. චෝදනාකරුවන්ගේ පදිංචි ලිපිනයන් වෙනස්වීම, විදේශ ගත වීම, ලබා දී ඇති ලිපිනයන් නිවැරදි නොවීම යනාදී කාරණා මත මෙම නඩු නොවිසඳී පැවතිණි. ඒවා සක්‍රීය කර ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් මඟින් විසඳීමට හෝ කම්කරු නිලධාරීන් මේ සඳහා සෘජුව දායක කර ගැනීමට ප්‍රමාණවත් විධිවිධාන යෙදීමට කළමණාකාරීත්වය කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.

- 2016 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් කම්කරු කාර්යාල වෙතින් ලබාගත් තොරතුරු අනුව කම්කරු කාර්යාල 52 ක් අතුරින් මුලතිව් කාර්යාලය හැර අනෙකුත් කාර්යාල වල 2016 දෙසැම්බර් 31 දිනට නොවිසඳී පැවති පෙත්සම් හා පැමිණිලි සංඛ්‍යාව 11,265 ක් විය.

- 2016 දෙසැම්බර් 31 දිනට කම්කරු කාර්යාල 19 ක නිකුත් නොකළ ප්‍රථම නිවේදන සංඛ්‍යාව 1,674 ක් වූ අතර කම්කරු කාර්යාල 21 ක නිකුත් නොකළ අවසන් නිවේදන සංඛ්‍යාව 1,476 ක් විය.

**(vii). කම්කරු නිලධාරීන්ගේ කාර්යසාධනය**

- 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව කම්කරු නිලධාරීන් විසින් මසකදී අවම වශයෙන් කාලීන පරීක්ෂණ 20 ක් සිදුකළ යුතු වේ. එසේ වුවත් කම්කරු කාර්යාල 49 ක් විසින් එලෙස සිදු නොකළ ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව 17,113 ක් විය.

- 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1(iv) ඡේදය ප්‍රකාරව දිගුකලකින් පරීක්ෂාවට භාජනය නොවූ ආයතන පරීක්ෂාවට ලක් කිරීම සඳහා සහකාර කම්කරු කොමසාරිස්වරයකු විසින් තෝරා දිය යුතු විය. ඒ අනුව ක්ෂේත්‍ර පරීක්ෂණ 20 න් 10 ක් සහකාර කම්කරු කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි විය යුතු වේ. එසේ වුවද කම්කරු කාර්යාල 26 ක් එලෙස සිදු නොකල මුළු පරීක්ෂණ සංඛ්‍යාව 14,022 ක් විය.

- 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව අදාල මාසයේ දින පොත් ඊලඟ මාසයේ 10 දිනට ප්‍රථම සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවත් කම්කරු කාර්යාල 44 ක ප්‍රමාදව ඉදිරිපත් කරන ලද දින පොත් සංඛ්‍යාව 1,648 ක් විය. මෙය ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අධීක්ෂණයේ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය කෙරේ.

- 2007 ඔක්තෝබර් 31 දිනැති 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය 3.1 ඡේදය ප්‍රකාරව සෑම පරීක්ෂණයකටම අදාල වාර්තා නොපමාව කාර්යාලයට භාරදිය යුතු වේ. එසේ වුවත් කම්කරු කාර්යාල 16 ක් විසින් එලෙස ඉදිරිපත් නොකරන ලද පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 2,471 විය.

**(viii). කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු කටයුතු පරිගණකගත කිරීමේ වැඩසටහනේ කාර්යසාධනය (LISA)**

---

- 2016 දෙසැම්බර් 31 දිනට කම්කරු කාර්යාලයන්හි නඩු, පෙත්සම් හා පැමිණිලි, පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම, අර්ධ මාසික චාරිකා වැඩසටහන් ඉදිරිපත් කිරීම සම්බන්ධ තොරතුරු හා LISA පද්ධතියට ඇතුළත් කර ඇති තොරතුරු අතර සැලකිය යුතු නොසැසඳීමක් දක්නට තිබුණි. එබැවින් LISA පද්ධතියෙන් ලබාදෙන තොරතුරුවල නිවැරදිභාවය පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

- කම්කරු නිලධාරීන් විසින් මෙම තල පරිගණක වෘත්තීය ක්‍රියාමාර්ග සම්බන්ධ හේතු ඉදිරිපත් කරමින් 2017 ජූලි 25 දිනය වන විටත් ආයතනික කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. එම වත්කම් නැවත පවරාගෙන හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් මඟින් හෝ LISA වැඩසටහනේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කළමණාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

- 2015 දෙසැම්බර් 31 දිනට LISA වැඩසටහනට සෘජුවම දායක වූ එහෙත් තල පරිගණක ලබා දී නොතිබූ නිලධාරීන් සංඛ්‍යාව 114 ක් විය. එය එම මුළු

නිලධාරීන් ප්‍රමාණයෙන් සියයට 22 ක් විය. එසේම සමාලෝචිත වර්ෂ අවසාන වන විට එම තත්ත්වය සියයට 92 ක් වූ අතර පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙහිලා කළමණාකාරිත්වයේ සැලසුම් කිරීමේ අවිධිමත්භාවය හා පද්ධතියේ පවත්නා අකාර්යක්ෂමතාවය ඉන් තවදුරටත් තීව්‍ර වී තිබුණි.

## 3.9 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ශ්‍රී ලංකා රේගුව විසින් රාජ සන්තක කරන ලදුව පසුව දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා යොදාගෙන තිබූ වෑන් රථයක් පැහැර ගැනීමකට ලක් වී තිබුණි. නමුත් වාහනයේ අලාභ හානිය හා නැතිවූ වටිනාකම් පිළිබඳව උපරිම අගය මුදල් රෙගුලාසි 105 (1) ප්‍රකාරව හඳුනාගෙන නොතිබුණි. ඒ පිළිබඳ වූ වාර්තා ද මුදල් රෙගුලාසි 104 (2) ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබුණි. එමෙන්ම අලාභ හානිය සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාව හා 104(4) ප්‍රකාර පූර්ණ වාර්තාව 2012 අප්‍රේල් 03 දින එනම් වසර 10 ක කාලයක් ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි.

## 3.10 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 710.94 ක වටිනාකමක් සහිත කම්කරු කාර්යාල ඉදිකිරීම් 12 ක් සම්බන්ධයෙන් සත්‍ය වශයෙන් ඉදිකිරීම් නිම කල කාලපරිච්ඡේද සහ සම්පූර්ණ කිරීම් වාර්තා (Completion Certificate) පිළිබඳ තොරතුරු ඇතුලත් විධිමත් දත්ත ගබඩාවක් දෙපාර්තමේන්තුව තුල නඩත්තු කරන බවට වගබලා ගැනීමට කළමණාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) කළුතර කම්කරු කාර්යාලයට අයත් පයාගල, බේරුවල හා තෙබුවන බල ප්‍රදේශවල පවත්නා ආයතන 1,100 ක් සම්බන්ධයෙන් ඊට අනුයුක්ත කර සිටි කම්කරු නිලධාරීන් විසින් වර්ෂ 1 ½ ක පමණ කාලයක සිට නිසි පරිදි පරීක්ෂණ සිදු කර නොතිබුණි. මෙලෙස වැඩි ආයතන සංඛ්‍යාවක් නිසි පරීක්ෂණයකට ලක් නොවීම නිසා එම ආයතනවල සේවයේ නියුතු සේවකයන්ට කම්කරු කාර්යාල හරහා ඉටු වියයුතු නිසි සේවය/ සුරක්ෂාව ඉටු වී නොතිබුණි. කෙසේ නමුත් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 210 | 161 | 50 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 668 | 363 | 305 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,771 | 1,434 | 337 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 489 | 442 | 49 | 02 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **3,138** | **2,402** | **741** | **05** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 355 ඇතුළුව පැවති මුළු පුරප්පාඩු 738 පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ IV වැනි පරිච්ඡේදයේ 3.3 වගන්තිය ප්‍රකාරව 2012 වර්ෂයේ සිට අනියම් පදනමින් බඳවාගෙන ඇති ලසුලේඛක තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.